# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2140/54 - 2019 සැප්තැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, මුල්ලේපිහිල්ල ඉහළ සේවා ජලාශය ඉදි කිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය ව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1498

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 274, වැවතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අළුපතකඩ ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ජේ. පී. කේ. වීරකෝන් මහත්මිය විසින් මැන සකස් කරන ලද, අංක 0215 - S දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 න් කොටසක් ලෙස දැක්වෙන, ''අළුපතකඩ හේන සහ ඔරුවේහේන'' නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 13.6 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

1A - G 30979 — 28 (2019/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කැබලි අංක : 1 න් කොටසක්
ඉඩමේ නම : අළුපතකඩ හේන සහ ඔරුවේහේන
ඉඩමේ ප්‍රමාණය : පර්චස් 13.6

මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ අලුපොත කඩහේන හා ඔරුවේ හේන ; |
| *නැගෙනහිරට* | : | ඔරුවේ හේන (ගෙවත්ත) ; |
| *දකුණට* | : | අංක 0215 - S දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 2 (ප්‍රවේශ මාර්ගය) ලෙස දක්වෙන සීමා සහිත අරලිය ග්‍රෑන්ඩ් කලම්බු හොටෙල් (පුද්ගලික) ආයතනය හිමිකම් කියන අළුපතකඩ හේන ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : කල්‍යාණ ප්‍රබෝධ දිසානායක මහතා,
වී. සී. අංක 305,
අළුපතකඩ,
පල්ලේගම.

09 - 913